# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 32 දරන
# කාර්මික ආරාවුල්
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 අගෝස්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 අගෝස්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.05 යි. නැපැල් ගාස්තුව : රු. 1.00 යි,

1990 අංක 32 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 අගෝස්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 3/89

**කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1990 අංක 32 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන කාර්මික ආරාවුල් පනතේ 31අ වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට, මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 131 වන අධිකාරයේ 31අ වගන්තිය සංශෝධනය කිරීම.

"(2) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින්, කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව,—

(අ) 31ආ වගන්තිය යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි අකාරය; සහ

(ආ) මේ කොටස යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් ඉදිරියේ පැවැත්වෙන යම් නඩු කටයුත්තක දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය

නියම කරන නියෝග සාදනු ලැබිය හැකි ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"31 ආ වගන්තිය යටතේ වූ ඉල්ලීම් සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය අධිකාර සතු කාර්ය සහ බලතල.

31ඇ. (1) කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත 31ආ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඒ ඉල්ලීම සම්බන්ධයෙන් අවශ්‍ය යයි ඒ විනිශ්චය අධිකාරය විසින් සලකනු ලබන සියලු පරීක්ෂණ පැවැත්වීමත්, සියලු සාක්ෂි විභාග කිරීමත්, ඉන් පසු ඒ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ දින සිට හය මාසයක් ඉකුත් වීමට පෙර සාධාරණ හා යුක්ති සහගතයැයි ඒ විනිශ්චය අධිකාරයට පෙනී යන ආඥාවක් කිරීමත්, ඒ විනිශ්චය අධිකාරයේ කාර්යය වන්නේ ය.

(2) පරීක්ෂණයක් පවත්වන කම්කරු විනිශ්චය අධිකාරයක් විසින්, ඒ විනිශ්චය අධිකාරය ඉදිරියේ නඩු කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් 31අ වගන්තිය යටතේ නියම කර ඇති කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු ය.".

2—ඩී 008765 7,190—(90/04)

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද ආඥාවකින් මතුවන නීති ප්‍රශ්නයක් මත මහාධිකරණයට අභියාචනය කිරීම.

31ඇ. (1) 31ආ වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ නඩුකටයුත්තක අවසානයේදී කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන සෑම ආඥාවක්ම වහාම හෝ ඒ ඉල්ලීමේ සෑම පාර්ශ්වකරුවකුටම සාධාරණ කාලයක් තුළදී කලින් දැනුම් දෙනු ලැබිය යුතු දිනයක විනිශ්චය අධිකාරයේ රැස්වීමක දී හෝ ප්‍රකාශයට පත් කළ යුතුය.

(2) මේ වගන්තියේ (3) වන උපවගන්තියෙන් සලස්වා ඇති විධිවිධාන ප්‍රකාර හැර, කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් අවසානාත්මක වන අතර එය කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

(3) කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් විෂයයෙහි ඒ විනිශ්චය අධිකාරය විසින් කරන ලද ආඥාවක් සම්බන්ධයෙන් ඒ ඉල්ලීම ඉදිරිපත් කළ සේවකයා හෝ වෘත්තීය සමිතිය හෝ ඒ ඉල්ලීමට අදාළ සේවායෝජකයා හෝ අනාප්තියට පත් අවස්ථාවක දී ඒ සේවකයා හෝ වෘත්තීය සමිතිය හෝ සේවායෝජකයා හෝ විසින්, අනෙක් පාර්ශ්වය වගඋත්තරකරු ලෙස සඳහන් කරනු ලබන ලිඛිත පෙත්සමක් මගින්, නීති ප්‍රශ්නයක් මත, ඒ ආඥාවට විරුද්ධව, එම කම්කරු විනිශ්චය අධිකාරය පිහිටා ඇති පළාත සඳහා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(4) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයකට, කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවකට විරුද්ධව අභියාචනය කරන හෝ එවැනි යම් ආඥාවකට විරුද්ධව ප්‍රතිශෝධන ඉල්ලීමක් කරන; හෝ

(ආ) කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයකු විසින් කරන ලද ආඥාවක් සම්බන්ධයෙන් ඒ සභාපතිවරයාට විරුද්ධව සර්ටියෝරාරි, තහනම, ප්‍රොසිඩෙන්ඩෝ හෝ මැන්ඩාමුස් යන ස්වභාවයේ වූ රිට් ආඥාවක් නිකුත් කිරීම සඳහා ඉල්ලීමක් කරන

සෑම සේවා යෝජකයකුම ඒ කම්කරු විනිශ්චය අධිකාරය වෙත—

(i) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වී ඇති ආඥාවෙන් විධාන කරනු ලබන්නේ සේවකයාට මුදලක් ගෙවීම පමණක් වන යම් කාරණයක දී ඒ මුදල හා සමාන මුදල් ප්‍රමාණයක ;

(ii) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වී ඇති ආඥාවෙන් විධාන කරනු ලබන්නේ සේවකයකු නැවත සේවයේ පිහිටුවීම පමණක් වන යම් කාරණයක දී ඒ සේවකයාගේ සේවය අවසන් කරන අවස්ථාවේ දී ඔහු ලැබූ මාසික වැටුපේ හෝ වේතනයේ දොළොස් ගුණයකට සමාන මුදල් ප්‍රමාණයක ;

(iii) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වී ඇති ආඥාවෙන් සේවකයාට මුදලක් ගෙවීමට සහ ඔහු නැවත සේවයේ පිහිටුවීමට විධාන කරනු ලබන යම් කාරණයක දී ඒ මුදලට සමාන මුදලක් සහ ඒ සේවකයාගේ සේවය අවසන් කරන අවස්ථාවේ දී ඔහු ලැබූ මාසික වැටුපේ හෝ වේතනයේ දොළොස් ගුණයකට සමාන මුදල් ප්‍රමාණයක

ඇපයක් මුදලින් තැබිය යුතු ය ;

සේවකයාගේ මාසික වැටුපේ හෝ වේතනයේ හෝ දොළොස් ගුණයකට සමාන මුදල් ප්‍රමාණයක ඇපයක් තබන ලෙස, මේ උපවගන්තියේ ඉහත සඳහන් ඡේද යටතේ සේවා යෝජකයකුට නියම කෙරෙන අවස්ථාවක, දෛනික වැටුපක් ගෙවනු ලබන සේවකයකු සම්බන්ධයෙන් වූ විට, එම මාසික වැටුප හෝ වේතනය හෝ එම සේවකයාගේ දෛනික වේතනයෙහි විසිහය ගුණයක් ලෙස සල කනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ ඇප මුදල් වශයෙන් සැපයෙන සියලු මුදල් සෑම කම්කරු විනිශ්චය අධිකාරයක ම සභාපතිවරයා විසින් ශ්‍රී ලංකාවේ යම් අනුමත බැංකුවක පොලිය සහිත තැන්පතු ගිණුමක තැන්පත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(6) 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත ඉදිරිපත් කරන සෑම අභි

යාචනා පෙත්සමකම රුපියල් පහක වටිනාකමින් යුත් අවලංගු නොකළ මුද්දර අලවා තිබිය යුතු අතර, ඉල්ලුම්කරු විසින් ඇප තැබීමට නියමිත සෑම කාරණයක දීම අභියාචක එසේ ඇප තබා ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් ඒ සමග විය යුතු ය. අභියාචනය කරනු ලබන්නේ යම් ආඥාවක් සම්බන්ධයෙන් ද ඒ ආඥාවේ දින සිට ගණන් බලන ලද (අභියාචනයට විෂයය වී ඇති ආඥාව කරනු ලැබූ දිනය ද ඇතුළුව එහෙත් ඉරු දින සහ ප්‍රසිද්ධ නිවාඩු දින අත් හැර) දවස් තිහක කාල සීමාවක් ඇතුළත, අභියාචන පෙත්සම මහාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(7) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයකට කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවකට විරුද්ධව (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන අභියාචනයක් හෝ එවැනි යම් ආඥාවකට විරුද්ධව කරනු ලබන ප්‍රතිශෝධන ඉල්ලීමක්, ඒ මහාධිකරණය විසින් ඒ අභියාචනය හෝ ඉල්ලීම මහාධිකරණයට ඉදිරිපත් කරන ලද දිනයේ සිට මාස හයක් ඇතුළත විභාග කොට අවසාන වශයෙන් නිම කරනු ලැබිය යුතු ය.

(8) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් කරන ලද සෑම ඉල්ලීමක් ම, ඒ උපවගන්තිය යටතේ තැබීමට නියම කර ඇති ඇප ඉල්ලුම්කරු විසින් තබා ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් සමග විය යුතු ය.

(9) මහේස්ත්‍රාත් අධිකරණයෙන් අභියාචනාධිකරණය වෙත කරන අභියාචන හා සම්බන්ධව, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXVIII වන පරිච්ඡේදයේ ඇති විධිවිධාන, මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන අභියාචන විභාග කිරීම සහ ඒවා පිළිබඳ කටයුතු නිම කිරීමට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(10) මේ වගන්තියෙහි—

"අනුමත බැංකුව" යන්නෙන්, මේ වගන්තියේ කාර්ය සඳහා, ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, තැන්පත්කරුවන්

ගේ ස්වාර්ථය සැලකිල්ලට ගෙන කලින් කල නියම කරනු ලැබිය හැකි බැංකුවක් අදහස් වේ; සහ

"සේවායෝජකයා" යන්නට තවදුරටත් සේවා යෝජකයකුව සිටීම නතර වී ඇති සහ 31අා වගන්තියෙහි (6) වන උපවගන්තියේ සඳහන් තැනැත්තෙක් ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 31 ඇඇ, 31 ඇඇඇ සහ 31 ඇඇඇඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**5.** මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තියට ඉක්බිතිවම ඇතුළත් කරනු ලබන අතර ඒවා ඒ ප්‍රඥප්තියේ 31 ඇඇ, 31 ඇඇඇ සහ 31 ඇඇඇඇ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

"මහාධිකරණයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීම සහ අභියාචනයේ දී ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල.

31ඇඇ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලද මහාධිකරණයක් විසින්, කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් සම්බන්ධයෙන් ඒ වෙත නීතියෙන් පැවරී ඇති අභියාචන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඒ වෙත නීතියෙන් පැවරී ඇති ප්‍රතිශෝධන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ඒ මහාධිකරණය විසින් කරන ලද යම් අවසාන ආඥාවකින් අනාප්තියට පත් යම් සේවකයකු හෝ වෘත්තීය සමිතියක් හෝ සේවා යෝජකයකු විසින් මහාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය කලින් ලබා ගෙන, ඒ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කළ හැකි ය.

(2) එවැනි යම් මහාධිකරණයක් වෙත 31ඇ වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඒ අධිකරණය විසින් කරන ලද යම් ආඥාවකට විරුද්ධව අභියාචනයේ දී තනි හා අනන්‍ය සංඥේය බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතුවන අතර එවැනි මහාධිකරණයක එවැනි යම් ආඥාවක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය; තවද යුක්තිය ඉෂ්ටවීම පිණිස අවශ්‍ය විය හැකි විධාන යම් කම්කරු විනිශ්චය අධිකාරයකට නිකුත් කිරීම හෝ අලුතෙන් නඩු විභාගයක් පවත්වන ලෙස නැතහොත් යම් නඩු කටයුත්තක් පිළිබඳ වැඩිදුර විභාග පවත්වන ලෙස ආඥා කිරීම කළ හැකි ය; තවද යුක්තිය ඉෂ්ටවීම පිණිස අවශ්‍ය වේ නම්, අලුතෙන් හෝ වැඩිදුර සාක්ෂි කැඳවීම හා පිළිගැනීම සහ එවැනි අවස්ථාවකදී එවැනි සාක්ෂි ඒ මහාධිකරණය හෝ කම්කරු විනිශ්චය අධිකාරය විසින් වාර්තාගත කළ යුතු යැයි විධාන කිරීම ද කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක්, ඒ අභියාචනය ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද දින සිට අවුරුදු එකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාග කොට අවසාන වශයෙන් නිම කරනු ලැබිය යුතු ය.

අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් සහ ඒ අධිකරණයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන අභියාචන අවුරුදු එකක් ඇතුළත නිම්කොට අවසන් කරනු ලැබිය යුතු බව.

31ඈඈඈ. (1) කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයකු විසින් කරන ලද ආඥාවක් සම්බන්ධයෙන් ඒ විනිශ්චය අධිකාරයේ සභාපතිවරයාට විරුද්ධව සර්ටියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ හෝ මැන්ඩැමුස් යන ස්වභාවයේ වූ රිට් ආඥාවක් නිකුත් කිරීම සඳහා අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ ඉල්ලීම අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ දින සිට අවුරුදු එකක් ඇතුළත ඒ අධිකරණය විසින් ඒ ඉල්ලීම විභාග කොට අවසාන වශයෙන් නිම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ පරිදි එවැනි යම් ඉල්ලීමක් මත අභියාචනාධිකරණය විසින් කරන ලද ආඥාවකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ අභියාචනය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ දින සිට අවුරුදු එකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ අභියාචනය විභාග කොට අවසාන වශයෙන් නිම කරනු ලැබිය යුතු ය.

අභියාචනය හෝ ඉල්ලීම පිළිබඳ නිශ්චය කළ විට, ඇප මුදල ආපසු ගෙවීම.

31ඈඈඈඈ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත, 31ඈ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවකට විරුද්ධව ඒ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිශෝධන ඉල්ලීමක් මත ඒ මහාධිකරණය විසින්—

(අ) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වන්නේ යම් කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් ද, ඒ ආඥාව ස්ථිර කරනු ලැබූ විට සහ ඒ සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත 31ඈඈ වගන්තිය යටතේ මහාධිකරණයේ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති විට, 31ඈ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇපය, ඒ සඳහා එකතු වී ඇති

පොලිය ද සමඟ ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් සේවක යාට ගෙවීමට සැලැස්විය යුතු ය;

(ආ) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වන්නේ යම් කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් ද, ඒ ආඥාව ප්‍රතිවර්තනය කරනු ලැබූ විට සහ ඒ සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත 31ඈඈ වගන්තිය යටතේ ඒ මහාධිකරණයේ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචන යක් ඉදිරිපත් කරනු ලැබ නොමැති විට, 31ඈ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇපය, ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමඟ, ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින්, සේවා යෝජකයාට ආපසු දීමට සැලැස්විය යුතු ය;

(ඇ) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වන්නේ යම් කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් ද, ඒ ආඥාව වෙනස් කරනු ලැබූ විට සහ ඒ සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත 31ඈඈ වගන්තිය යටතේ ඒ මහාධිකරණයේ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති විට, ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින්, මහාධිකරණයේ ආඥාව අනුව කටයුතු කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය, ඒ මුදල සඳහා වන පොලිය ද සමඟ, 31ඈ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇප මුදලින් සේවකයාට ගෙවීමට සැලැස්විය යුතු අතර ඒ ඇප මුදලින් සහ ඒ මුදල සඳහා වන පොලියෙන් යම් ශේෂයක් ඇතිනම් එය සේවා යෝජකයාට ආපසු දීමට සැලැස්විය යුතු ය.

(2) කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් සම්බන්ධයෙන් සර්ටියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ හෝ මැන්ඩමුස් යන ස්වභාවයේ වූ රිට් ආඥාවක් ප්‍රදානය කිරීම සඳහා අභියාචනාධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත, අභියාචනාධිකරණය විසින්--

(අ) ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලබන්නා වූ සහ ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඉඩ දී ඇති කාලය ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද අවස්ථාවක 31ඇ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇප මුදල ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමඟ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් සේවකයාට ගෙවීමට සැලැස්විය යුතු ය;

(ආ) කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව නිෂ්ප්‍රභ කරනු ලබන්නා වූ සහ අභියාචනාධිකරණයේ ආඥාවට විරුද්ධව ඉඩ දී ඇති කාලය ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද අවස්ථාවක, 31ඇ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇප මුදල ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමඟ ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින්, සේවායෝජකයාට ආපසු දීමට සලස්වනු ලැබිය යුතු ය;

(ඇ) කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව වෙනස් කරනු ලබන්නා වූ සහ අභියාචනාධිකරණයේ ආඥාවට විරුද්ධව ඉඩ දී ඇති කාලය ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද අවස්ථාවක, ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින්, අභියාචනාධිකරණයේ ආඥාව අනුව කටයුතු කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය ඒ මුදල සඳහා පොලිය ද සමඟ 31ඇ (4) වගන්තිය යටතේ තබන ලද ඇප මුදලින් සේවකයාට ගෙවීමට සැලැස්විය යුතු අතර, ඒ ඇප මුදලින් සහ ඒ මුදල් සඳහා වන පොලියෙන් යම් ශේෂයක් ඇත්නම්, එය සේවායෝජකයාට ආපසු දීමට සැලැස්විය යුතු ය.

(3) පහත දැක්වෙන අවස්ථාවලින් ඕනෑම අවස්ථාවක, එනම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක ආඥාවකට විරුද්ධව 31ඇඇ වගන්තිය යටතේ තමන් වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාව

කට විරුද්ධව ඒ මහාධිකරණය වෙත කරන ලද ප්‍රතිශෝධන ඉල්ලීමක් මත වූ ඒ මහාධිකරණයේ ආඥාවකට විරුද්ධව තමන් වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයා විසින් කරන ලද ආඥාවක් සම්බන්ධයෙන් ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයාට විරුද්ධව සර්ටියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ හෝ මැන්ඩාමුස් යන ස්වභාවයේ වූ රිට් ආඥාවක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමකට අවසර දෙමින් හෝ එය ප්‍රතික්ෂේප කරමින් හෝ ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව වෙනස් කරමින් කෙරුණු අභියාචනාධිකරණයේ ආඥාවකට විරුද්ධව තමන් වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින්—

(අ) ඒ අභියාචනයට විෂය වූ කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව ස්ථිර කරනු ලබන අවස්ථාවක, 31ඇ (4) වගන්තිය යටතේ තබන ලද ඇප මුදල ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමග ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින්, සේවකයාට ගෙවීමට සැලැස්විය යුතු ය.

(ආ) ඒ අභියාචනයට විෂය වූ කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව ප්‍රතිවර්තනය කරනු ලබන අවස්ථාවක, 31ඇ (4) වගන්තිය යටතේ තබන ලද ඇප මුදල, ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමග ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් සේවායෝජකයාට ආපසු දීමට සැලැස්විය යුතු ය;

(ඇ) අභියාචනයට විෂය වූ කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව වෙනස් කරනු ලබන අවස්ථාවක, ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින්, ශ්‍රේෂ්ඨාධිකරණයේ ආඥාව අනුව කටයුතු කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය, ඒ මුදල සඳහා වන පොලිය ද සමග 31ඇ (4) වගන්තිය යටතේ තබන ලද ඇප මුදලින් සේවකයාට ගෙවීමට සලස්වනු ලැබිය යුතු අතර. ඒ ඇප මුදලින් සහ ඒ මුදල සඳහා වන පොලියෙන් යම් ශේෂයක් ඇත්නම්, එය සේවායෝජකයාට ආපසු දීමට සැලැස්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තියේ (ඊඊ) ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(2) එහි (2) වන උපවගන්තියේ "අමාත්‍යවරයා විසින් සාදන ලද" යන වචන වෙනුවට "මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 31අ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ සාදන ලද" යන වචන ආදේශ කිරීමෙන්.

විනිශ්චයට භාජනය වී තිබෙන නඩු.

7. (1) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී 31අ වගන්තිය යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත කරන ලද යම් ඉල්ලීමක් ඒ විනිශ්චය අධිකාරය ඉදිරියේ විනිශ්චයට භාජනය වී තිබෙන අවස්ථාවක, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් සියලු විමසීම් කර, අවශ්‍ය යයි විනිශ්චය අධිකාරය සලකන සියලු සාක්ෂි විභාග කිරීමෙන් පසුව, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට සය මාසයක් ඉකුත් වීමට පෙර සාධාරණ සහ යුක්තිසහගත යයි විනිශ්චය අධිකාරයට පෙනී යන ආඥාවක් කිරීම විනිශ්චය අධිකාරයේ කාර්යය විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවකට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් හෝ එවැනි යම් විනිශ්චය අධිකාරයක ආඥාවකට විරුද්ධව එය වෙත කරන ලද ප්‍රතිශෝධන ඉල්ලීමක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයා විසින් කරන ලද ආඥාවක් සම්බන්ධයෙන් ඒ සභාපතිවරයාට විරුද්ධව සර්ටියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ හෝ මැන්ඩාමුස් යන ස්වභාවයේ රිට් ආඥාවක් නිකුත් කිරීම සඳහා අභියාචනාධිකරණය වෙත කරන ලද යම් ඉල්ලීමක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවකට අදාළ වූ ඒ මහාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ ආඥාවකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් එවැනි යම් අධිකරණයක් ඉදිරියේ විනිශ්චයට භාජනය වී තිබෙන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, මහාධිකරණය, අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට එක් අවුරුද්දක් ඉකුත් වීමට පෙර ඒ අභියාචනය හෝ ඉල්ලීම විභාග කර ඒ පිළිබඳ අවසාන වශයෙන් නිම කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.